**ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
**------------------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැකිය.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2000 මැයි 10 දිනැති අංකඅමප/00/680/08/040 හා 1996 මාර්තු 21 දිනැති අංක 96/0775/105/032 දරන අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව අත්තිකාරම් කාර්යයන් 5ක් වසා දැමීමට තීරණය කර තිබුණි. මුදල් රෙගුලාසි 518(3) ප්‍රකාරව අත්තිකාරම් කාර්යයක් වසා දැමීමෙන් පසු එළඹෙන වර්ෂයේදී ඇවර කිරීමේ කටයුතු නිම කළ යුතු වුවත්, වර්ෂ 14 සිට වර්ෂ 26 දක්වා කාලයක් ගත වී තිබුණත් ඇවර කිරීමේ කටයුතු නිමකර ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වර්ෂ 03 කට වැඩි ප්‍රමාදයන් සිදුකර ඇති විට ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව අමාත්‍යාංශයේ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | මෙම ඇවර ගිණුම් පහ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ශුන්‍ය කර වසා දමා අවසානයක් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.2 වාණිජ අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කල්පිත ගාස්තු ගැලපීමෙන් පසුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.135,093,450 කින් පහත වැටී තිබුණි. | වාණිජ අත්තිකාරම් ගිණුමෙහි ලාභය උපරිම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | අත්තිකාරම් කටයුත්තට අදාළ ප්‍රාග්ධන වත්කම්වල ක්ෂය වටිනාකම හා ක්ෂය සංචිත අරමුදලේ වටිනාකම නිවැරදිව ගණනය කර නොතිබුණි. | වත්කම් ක්ෂය නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. | 2019 වසරේදී මෙය යථාවත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | වත්කම් වර්ගීකරණය කර ගිණුම්ගත කර නොතිබුණු අතර ඒ අනුව ක්ෂය ගණනය කර නොතිබුණි. | වත්කම් පංතීන් වෙන වෙනම ගිණුම් ගත කළ යුතු වීම. | තවදුරටත් යථාවත් කරගෙන ඉදිරියේදී මෙම වර්ගීකරණය නිවැරදි කරගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | ස්ථිර වැටුප් වියදමින් සියයට 85 ක් නිෂ්පාදන ගිණුමේ හා ඉතිරි සියයට 15 ලාභලාභ ගිණුමේ දක්වා තිබුණ ද | ආයතනය විසින් අනුගමනය කරන ගිණුම්කරණ පදනම හා | අත්තිකාරම් ගිණුමෙන් ගෙවීම් කරන ලද වැටුප්වලින් වක්‍ර වියදම් ලෙස ලාභාලාභ |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්ගත කිරීමේ පදනම හා ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. | ගිණුමේ පෙන්නුම් කරන අතර, ඉතිරි සියයට 85 සෘජුවම නිෂ්පාදන ගිණුමට අදාළ වන බැවින් එහි පෙන්නුම් කරනු ලැබේ. |
| (ඉ) | වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළ ආයතන 75 ක වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර ක්ෂය ගැලපීම් කර තිබුණ ද, එම එක් එක් ආයතන මඟින් වන දායකත්වය අනුව ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම හා ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල නිශ්චිතව දක්වා නොතිබුණි. | ආයතනය අනුගමනය කරන ක්ෂය ප්‍රතිපත්තිය මත ක්ෂය කර අදාළ ගැලපීම් සිදුකළ යුතු වීම. | අප විසින් ක්ෂය කර ඇති ආකාරය නිවැරදිය. |
| (ඊ) | කරදියනාරු ගොවිපළ සතු ගොඩනැගිලි විෂයයන් 15 ක් අගය කර ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් අගය කර එම වටිනාකම් පොත්වලට ගත යුතු වීම. | යුද්ධය නිමාවීමත් සමඟම මෙය සක්‍රීය කරගනිමින් දැනට වැඩිදියුණු කරමින් පවතී. |
| (උ) | කරදියනාරු නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට 2018 ජූනි මස ලැබී තිබුණු මෝටර් සයිකලයේ වටිනාකම අගය කර ඊට අදාළ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණු අතර, 2014 හා 2017 වර්ෂවල ලැබී තිබුණු මෝටර් රථ 03 කට අදාළ ආරම්භක සමුච්චිත ක්ෂය රු.769,155 ක් ගිණුම්ගත කර නොතිබුණි. ඊට අමතරව මෝටර් රථවල වර්ෂයේ ක්ෂය රු.203,085 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර වත්කම්වල වටිනාකම අදාළ වර්ෂවල පොත්වලට ඇතුළත් කර ඒ අනුව නිවැරදිව ක්ෂය ප්‍රතිපාදන කළ යුතු වීම. | ඔබගේ පෙන්වාදීම් ද අනුගමනය කරමින් මුදල් රෙගුලාසි 515 හි වන ප්‍රතිපාදන මත මෙය ගැලපුම් කරනු ලැබේ. |
| (ඌ) | වවුනියාව නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ තිබූ රු.3,540,587 ක් වටිනා යන්ත්‍රෝපකරණ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. | -එම- |
| (එ) | ගන්නෝරුව එළවළු බීජ මධ්‍යස්ථානයේ ඉවත් කරන ලද යන්ත්‍රෝපකරණ වටිනාකම රු.3,417,280 කින් වැඩියෙන් දැක්වීම නිසා වර්ෂයේ ක්ෂය රු.170,864 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි ක්ෂය ප්‍රමාණය ගණනය කර ගිණුම් ගත කළ යුතු වීම. | ඉවත් කරන වසරට ක්ෂය ගණනය කරනු නොලැබේ. |
| (ඒ) | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයක හා ගොවිපළ 03ක ට්‍රැක්ටර්,ටේලර් හා මෝටර් රථවල ආරම්භක සමුච්චිත ක්ෂය රු.1,266,050 | නිවැරදි ආරම්භක සමුච්චිත ක්ෂය ගිණුම් තුළ ඇතුළත් කළ යුතු වීම. | වරින්වර සොයාගන්නා අයිතම්වල නැවත ක්ෂය ගණන් බලා සංශෝධනය කරගනු ලැබේ. ඒ අනුව, අප |

| | | | |
|---|---|---|---|
| | කින් අඩුවෙන් දක්වා තිබුණි. | | විසින් දක්වා ඇති ගණන් නිවැරදිය. |
| (ඔ) | සීතාඑළිය බීජ අර්තාපල් ගබඩාවේ පැවති රු.5,012,700 ක ට්‍රැක්ටර් හා ටේලර් වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළව ක්ෂය රු.125,318 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් අගය කර එම වටිනාකම් පොත්වලට ගෙන ක්ෂය ප්‍රතිපාදනය කළ යුතු වීම. | මෙම වත්කම් සම්බන්ධයෙන් මුලින්ම සටහන් කළ ලේඛන දිරාපත්ව විනාශ වී ඇති බැවින් සොයාගත නොහැකිය. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.49,827,685 ක්වූ වත්කම් හා බැරකම් විෂයයන් 03 ක් සඳහා ශේෂ සනාත කිරීම් හා වත්කම් අත්පත් කර ගැනීම් හා ඉවත් කිරීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | ශේෂ තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. | 2012 වසරෙන් මෙපිටට ණයගැතියන්ගෙන් මුදල් අයකරගැනීම සම්බන්ධයෙන් වැඩිපුර අවධානය යොමුකර ඇති අතර, ඒ සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ග ගැනීමටද කටයුතු කර තිබේ. මෙම ණයහිමි ශේෂය තහවුරුව ලබාගත යුත්තේ ලේකම්වරයාගෙනි. ඒ සම්බන්ධයෙන් අප විසින් කළ විමසීම්වලට මේ වන විට පිළිතුරු ලැබී නැත. |
| (ක) | ස්ථාවර වත්කම්වල ආරම්භක ශේෂය හා ඉකුත් වර්ෂයේ අවසන් ශේෂය අතර රු.17,694,398 ක වෙනසක් විය. | ආරම්භක ශේෂය නිවැරදිව දැක්විය යුතුබව. | අප විසින් සිදුකරනු ලැබුයේ එකී හේතු අනාවරණය කරගෙන 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය නිවැරදි කොට 2018 ආරම්භක ශේෂය නිවැරදි අගය ලෙසට ගෙන ඉදිරියට කටයුතු කිරීමයි. |
| (ග) | ණයගැති ශේෂ සනාථ හා උප ලේඛනයේ දක්වා ඇති ණයගැති වටිනාකම් අතර රු.500,800 ක වෙනසක් විය. | ණයගැති ලේඛනය හා ණයගැති ශේෂ සනාථ සැසඳිය යුතුවීම. | ඇතැම් ණයගැතියන් ශේෂ තහවුරු එවීමේදී වෙනස්කම සිදුවී ඇත. එම නිසා අපගේ පොත්වල පවතින ශේෂ නිවැරදිය. |

1.6.3 **ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම්**

pahata

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම් 4 කට අදාළව වර්ෂ 17 සිට වර්ෂ 26 ක් දක්වා කාලයක | මුදල් රෙගුලාසි 513 හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 132අ(3) හා (4) නියෝග අනුව කටයුතු කළ | අත්තිකාරම් ගිණුම් 04 ඇත්තේ, කාරක පාඩු පමණි. එහෙයින් එය ඉවත් කර ගැනීම උදෙසා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර තිබේ. |

| | | | |
|---|---|---|---|
| | සිට පැවත එන අනුමත නොකළ සමුච්චිත කාරක පාඩු එකතුව රු.65,842,264 ක් විය. | යුතු වීම. | |
| (ආ) | සහතික කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය අත්තිකාරම් කාර්යය ඇවර කිරීමේ ගිණුමට අදාළ වර්ෂ 28 කට අධික කාලයක සිට පවතින රු.1,303,832 ක අයවිය යුතු ශේෂ හා වර්ෂ 28 ක් ඉක්මවා තිබුණු රු.76,157 ක් වූ පියවිය යුතු ශේෂ පැවතුණි. | මුදල් රෙගුලාසි 518 අනුව කටයුතු කළ යුතු වීම. | ණයහිමියන් සම්බන්ධයෙන් අදාළ විමසීම් සිදුකර රජයේ ආදායමට බැර කිරීමට තීරණය කර තිබේ. ණයගැතියන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 14(4) යටතේ පරීක්ෂණයක් සිදුකර ඇත. |

**1.6.4 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය හා 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ සඳහන් වටිනාකම අතර රු.8,092,884 ක වෙනසක් පැවතුනි. | භාණ්ඩාගාර වාර්තා සමඟ සසදා නිවැරදි අගය ගිණුම්ගත කළ යුතු වීම. | නව විධිවිධාන යටතේ වත්කම් ගිණුම් තැබීම මෙම වසරේ මූල්‍ය ප්‍රකාශන සඳහා හඳුන්වා දී තිබූ අතර, එම දෝෂ සඳහා භාණ්ඩාගාරය විසින් පරිගණක වැඩසටහන හඳුන්වා දීමෙන් මෙම දෝෂය නිවැරදි වනු ඇත. |

**1.6.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වැඩිපුර ගෙවීම් ලෙස දක්වා තිබූණු රු.620,741,594 ක් ගොවිපළ අත්තිකාරම් ගිණුම උදෙසා භාණ්ඩාගාරයෙන් ලැබීම් හා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යටතේ අයවීම් වුවද එම වටිනාකම මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා නොතිබුණි. | මුදල් ගලා ඒම් සහ ගලා යාම් අදාළක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වීම. | මෙම දෙකෙහි එකතු ගත් කළ මුදලින් ලැබුණු සත්‍ය ප්‍රමාණය ඉක්මවා වැඩිපුර ගෙවීම් රු.620,741,594 ක් විය. එය ගිණුමේ ඇතුළත් කරන ලදි. |

**1.6.6 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් රු.මිලියන 5,497 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අග්‍රිම ලැබීම් රු.මිලියන 5,477.6 ක් වූයෙන් රු.මිලියන 19.4 ක වෙනසක් පැවතුනි. | අග්‍රිම ලැබීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වීම. | අවසන් වාර්තාවට තොරතුරු පිටපත් කිරීමේදී තීරු මාරු වීමෙන් මෙම වෙනස සිදු වී ඇත. |

**1.6.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම |
| --- | --- | --- |
| (අ) **පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ලේඛනය යාවත්කාලීන කළ යුතු වීම. | යථාවත් කරගැනීමට විධිවිධාන සලසා තිබේ. |
| (ආ) **ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මෙය බොහෝ දුරට යාවත්කාලීන වී ඇත. |
| (ඇ) වාහන ලොග් පොත | | |
| මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි. | සෑම වාහනයක් සම්බන්ධයෙන්ම වාහන ලොග් පොත් පවත්වා ගත යුතු විම. | -එම- |
| (ඇ) වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව | වාහන ලැයිස්තුගත | දැනට කොම්ප්ට්‍රොලර් |

| | | |
|---|---|---|
| වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතු විම. | ජනරාල්වරයාගේ උපදෙස් අනුව අදාළ ලැයිස්තු වත්කම් කළමනාකරණ ශාඛාව මඟින් සකස් කර ඇත. |

**1.6.8 විගණන සාක්ෂි නොවීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08කට 2019 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 32.35 ක් විය. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව විගණන විමසුම්වලට වහාම පිළිතුරු ලබා දිය යුතු අතර එසේ පිළිතුරු ලබාදිම ප්‍රමාද විය හැකි විමසුම් වේ නම් ඒ සඳහා අතුරු වාර්තාවක් යැවිමට කටයුතු කළ යුතු විම. | අදහස් දක්වා නොතිබුණි. |

**1.6.9 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | | |
| (ආ) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතායට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.9 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 1.6.8 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි. | -එම- | -එම- |

**1.6.10 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| **නිරීක්ෂණය** | | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47 වගන්තිය | - | නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධාන නොසළකා තෙලිජ්ජවිල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාලයේ අළුතින් ඉදිකරන ලද අලෙවිසැල ප්‍රධාන තාප්පයට සම්බන්ධ කර ඉදිකර තිබුණි. | ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | මෙහිදී හිතාමතා පවතින ඉදිකිරීම් සීමාවන් නොසළකා කටයුතු නොකල බව අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන) විසින් මා වෙත දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| (i) xix පරිච්ඡේදයේ 5 වගන්තිය | 150,996 | මොනරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර්පළාත්) කාර්යාලයේ සේවය කරනු ලබන නිලධාරීන් දෙදෙනෙකුගෙන් නිල නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ සඳහන් පරිදි නිල නිවාසවල කුලී අය කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව ගණකාධිකාරී (වැටුප් කළමනාකරණ I) වෙත මවිසින් දන්වා ඇත. |
| (ii) xix පරිච්ඡේදයේ 6.1 වගන්තිය | - | දෙපාර්තමේන්තුවට අයත් ආයතන 5 ක සේවය කරනු ලබන නිලධාරීන් වසර 01 සිට වසර 13 දක්වා කාලයක් නිල නිවාසවල අඛණ්ඩව පදිංචිවී සිටින බව නිරීක්ෂණය විය. | යම්කිසි තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියළුම නිවාසවල උපරිම බදු කාලය වර්ෂ 05 ක සීමාව අනුව කටයුතු කළ යුතු වීම. | ආයතන සංග්‍රහයේ 6.12 වගන්තිය අනුව බදු කාලය දීර්ඝ කළ අතර පොරොත්තු ලේඛනයේ සිටින මාණ්ඩලික නිලධාරීන් නිවසක් ඉල්ලා සිටින්නේ නම් වසර 05 ඉක්මවූ අය ඉවත් කොට ඔවුනට එය ලබා දීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) මුදල් රෙගුලාසි 103 | | මදුරුකැටිය බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැලේ විකිණීමට ඇති පැළ හා බීජ නැතිවීම් හා හානිවීම් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මැරී ඇති පැළ සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු සිදු කරනු ලැබේ. |
| (ii) මුදල් රෙගුලාසි 104 (3) | | 2002 නොවැම්බර් නාරාහේන්පිට නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට ලද ප්‍රරෝහණ ශක්තිය හීන තොගය පිළිබඳ බීජ හා රෝපණ ද්‍රව්‍ය අධ්‍යක්ෂ වෙත මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ඉදිරිපත් කර තිබූ ප්‍රාරම්භක වාර්තාව සම්බන්ධයෙන් | -එම- | ඒ පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කර නොතිබුණි. | | |
| (iii) මුදල් රෙගුලාසි 143 (2) (ඇ) | 2018 මාර්තු 02 දින සිට මුදල් අයකැමි යන්ත්‍රය අක්‍රීය වී පැවති නිසා ගන්නෝරුව බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි පියසේ පැළ අලෙවි කිරීමේදී ලදුපත් නිකුත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලදුපතක් නිකුත් කළ යුතු වීම. | මුදල් අයකැමි යන්ත්‍රය ක්‍රියා විරහිත වූ විටෙකදී පොදු 172 රිසිට්පත් යොදාගන්නා ලෙස අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන) වෙත මවිසින් දන්වා ඇත. |
| (iv) මුදල් රෙගුලාසි 177 හා 2010 සැප්තැම්බර් 23 දිනැති අංක 08/2010 දරන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 1.7 ඡේදය | ප්‍රාදේශීය කාර්යාල 4ක දින 4 සිට දින 13 දක්වා කාල ප්‍රමාදයකින් පසුව රු.2,670,404 ක් බැංකු ගත කර තිබුණි. | අලෙවියෙන් ලැබෙන මුදල් නොපමාව බැංකුගත කළ යුතු විම. | ප්‍රමාදයකින් තොරව මුදල් බැංකු ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (v) මුදල් රෙගුලාසි 502(2) | අත්තිකාරම් ගිණුම් කටයුත්ත වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | වත්කම් ලේඛනය යථාවත් කරගැනීමටත්, මහා භාණ්ඩාගාරය සමඟ ඒකාබද්ධ වෙමින් ඔවුන්ගේ තොරතුරු සමඟද සසඳා ජාතික ගිණුම් තුලට ඒවා ඇතුළත් කරගැනීමටත් විධිවිධාන යොදා ඇත. |
| (vi) මුදල් රෙගුලාසි 753(2) | දෙපාර්තමේන්තුවේ විවිධ ඒකක විසින් නිකුත් කරන ලද ද්‍රව්‍ය වෙනුවෙන් ලැබීම් නියෝග ගෙන්වා ගෙන නොතිබුණි. | භාණ්ඩ ලැබුණු බව ලැබීම් නියෝගයක් මඟින් තහවුරු කර ගත යුතු වීම. | මේ වන විට ඇතැම් ලැබීම් නියෝග ලබා ගෙන ඇති බව දක්වා ඇති අතර ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇත. |
| (vii) මුදල් රෙගුලාසි 880 හා 881 සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 11 දිනැති දෙපාර්තමේන්තු නියෝග 17/2015 | බෝඹුවල වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ හා ගන්නෝරුව එළවළු බීජ මධ්‍යස්ථානයේ නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි. | ඇප ආඥා පනතට අනුව ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | මේ පිළිබඳව දැනුවත් කර ඇති අතර අවශ්‍ය කටයුතු සිදු කිරීමට කළමනාකරණ සහකාර නිලධාරීනිය වෙත උපදෙස් ලබා දී ඇත. |

(ඇ) **වෙනත් චක්‍රලේඛ**

-------------------

| | | | |
|---|---|---|---|
| කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 සැප්තැම්බර් 23 දිනැති අංක 08/2010 දරන චක්‍රලේඛයේ 4 ඡේදය | දෙපාර්තමේන්තුවේ ඇතැම් පර්යේෂණ අංශවල පර්යේෂණ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | සියළුම තොරතුරු ඇතුළත් කර පර්යේෂණ තොරතුරු ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මෙය බොහෝදුරට යාවත්කාලීන කර ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **අග්‍රිම කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම ඉල්ලුම් කළද භාණ්ඩාගාරය විසින් ප්‍රමාණවත් පරිදි අග්‍රිම නිකුත් නොකිරීම නිසා එකතුව රු.මිලියන 916.36 ක් වූ අතැති බිල්පත් 2018 දෙසැම්බර් 31 දින වනවිට පැවතුණි. | අග්‍රිම නියමිත පරිදි ලබා දීමට කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නොතිබුණි. |

**2.2** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 66 විධිවිධාන ප්‍රකාරව වැය විෂයයන් 03 ක් වෙත මාරු කර ගත් ප්‍රතිපාදනයෙන් සියයට 21 ත් සියයට 151 ත් අතර පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. | දුරකතන වියදම් ප්‍රාග්ධන වැය සම්මත මඟින් ගෙවීම් කිරීමත්, සේනා දළඹුවා මර්ධනය සඳහා වෙනම ප්‍රතිපාදන ලබා දීමත් හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |
| (ආ) | ගන්නෝරුව පිහිටි ශාක ජාන සම්පත් බැංකුව අළුත්වැඩියා කිරීම සඳහා වූ රු.මිලියන 60 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | -එම- | පිරිවිතර සකස් කිරීමට වැඩි කාලයක් ගත වීමත් ලංසුකරු විසින් වැඩි මිල ගණන් ඉදිරිපත් කිරීමත් නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී |

| | | |
|---|---|---|
| (ඇ) පුනරාවර්ථන වැය විෂයයන් 38 ක හා මූලධන වැය විෂයයන් 33 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්වල ප්‍රතිපාදන උපයෝජනයෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙළින් සියයට 20 ක් හා සියයට 24 ක් විය. | -එම- | තිබුණි. වියදම් කළමනාකරණය කිරීමත් ඩොලරයේ අගය ඉහළ යාම නිසා ප්‍රසම්පාදනයන් ඉටු කිරීමට නොහැකි වීමත් බිල්පත් සැළසුම් කළ පරිදි ඉදිරිපත් නොවීමත් සේවක බඳවා ගැනීම් නිසි පරිදි සිදු නොකිරීමත් ඉතිරිවීම්වලට හේතු වී ඇත. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2019 වර්ෂයේදී අවස්ථා 197 කදී ගෙවා තිබුණු රු. මිලියන 2.99 ක වියදම් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 150 පරිදි සියළුම බැරකම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වීම. | වාර්තා නොකළ බැදීම් 2019 වර්ෂයේ ගෙවීම් කර ඇති බව ගණකාධිකාරී (මූල්‍ය කළමනාකරණ) - ශ්‍රී.ලං.ග.සේ I මඟින් මා වෙත දන්වා ඇත. |

## 2.4 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තැන්පත් කර වසර 02 ඉක්මවා තිබුණු රු.11,861,970 ක පොදු තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (3) විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඇතැම් තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිකුත් කර මාස 06 ඉක්මවා ඇති නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ එකතුව රු.127,927 ක් වූ චෙක්පත් 11 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරවුල් කරන ලෙස දැනුම් දී ඇත. |

**2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.8,197,445 ක් වූ අතරඑම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 24 දක්වා කාල පරාසයක පැවතුණි. | හිඟහිටි ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම ණයශේෂ පියවා ගැනීමට අප විසින් දැඩි උත්සාහයක් ගෙන ඇති අතර, ඉතා පැරණි නිසාම ප්‍රමාණවත් තොරතුරු සොයාගැනීමට නොහැකි වීමෙන් තවදුරටත් හිඟව පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අවස්ථා 14 ක දී සංශෝධනයට ලක් කර තිබූ අතර අවසාන වරට දෙසැම්බර් 28 දින දී පවා සංශෝධනයට ලක් කර තිබීම මත වාර්ෂික අයවැය පදනම්ව නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සැලැස්ම පිළියෙල කර තිබූ බව නිරීක්ෂණය විය. | 2014 පෙබරවාරි 14 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ගුණාත්මක බීජවල සුලභතාවය වැඩි කිරීම මූලික අරමුණ කර ගනිමින් ජාතික බීජ නිෂ්පාදනය හා මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබුවද ජාතික බීජ අවශ්‍යතාවයට දෙපාර්තමේන්තුව විසින් සපයන ලද දායකත්වය සියයට 2 ත් සියයට 30 ත් අතර පහළ මට්ටමක පවතින බව | රටේ අවශ්‍යතාවයට ගැලපෙන බීජ අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් නිපදවීමට දෙපාර්තමේන්තුවේ සම්පත් මෙහෙයවීම සිදු කළ යුතු වීම. | පසුගිය කන්න කිහිපය තුළ පැවති දැඩි නියඟය බීජ නිෂ්පාදනයට බලපා ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. |

| | | | |
|---|---|---|---|
| | නිරීක්ෂණය විය. | | |
| (ආ) | 2017 වර්ෂයේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් පස් සාම්පල් පරීක්ෂා කර ප්‍රාදේශීය වශයෙන් සුදුසු පොහොර නිර්දේශ ලබා දීමේ ව්‍යාපෘතියක් උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය හරහා ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනයට කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි පස් සාම්පල් පරීක්ෂා කිරීමේ වගකීම පැවරී තිබුණද 2018 ඔක්තෝබර් වනවිටත් සුදුසු පොහොර නිර්දේශ ලබාදීමට කටයුතු කර නොතිබුණි. | ජාතික අවශ්‍යතාවයක් වශයෙන් හඳුනාගෙන ඇති මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ සම්පත් මෙහෙයවීම සිදු කළ යුතු වීම. | ලබා දී ඇති පස් සාම්පල් ප්‍රමාණවත් නොවන බැවින්, පොහොර නිර්දේශ ලබා දීමට නොහැකි වී ඇත. |
| (ඇ) | සමශීතෝෂ්ණ එළවළු හා පලතුරු මුල් කර ගත් පර්යේෂණ සිදු කිරීම සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ අරමුණක් වුවද ආනයනික භෝග ප්‍රභේදයන් හඳුන්වාදීම සම්බන්ධ පර්යේෂණ සිදු කිරීමට අවධානය යොමු කර නොතිබුණි. | ආනයනික බීජ සම්බන්ධයෙන් පර්යේෂණයන් සිදු කර නව ප්‍රභේදයන් හඳුන්වා දීමට කටයුතු කළ යුතු වීම. | මෙම වර්ෂයේදී ගෝවා සහ කැරට් නව ප්‍රභේද සංවර්ධනය සහ ඒවායේ දෙමුහුන් බීජ නිෂ්පාදනය සඳහා පර්යේෂණ ආරම්භ කර ඇති බව අධ්‍යක්ෂ (උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන) විසින් මා වෙත දන්වා ඇත. |

## 3.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය යටතේ ''මිල්ලැව සුවඳැල්'' නම් කෙසෙල්වල අස්වැන්න ලබා ගන්නා කාලය නිශ්චය කිරීම හා උද්භිද විද්‍යාත්මක අත්හදා බැලීම් මඟින් ගෙඩි විශාල විම සඳහා වන බලපෑම අධ්‍යයන ව්‍යාපෘතිය වෙනුවෙන් රු.2,310,052 ක් වැයකර තිබුණද මෙම පර්යේෂණ සමාජයේ පවතින දැවෙන ගොවි ගැටළු නොවන බව නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය ගොවි ගැටළු හඳුනාගෙන පර්යේෂණ සැලැස්මක් සකස්කර ඒ අනුව නිලධාරීන් ඒ සඳහා යොමු කළ යුතු වීම. | මෙම පර්යේෂණය කිරීමට පෙර ශ්‍රී ලංකා කෘෂිකාර්මික ප්‍රතිපත්ති සභාවේ විද්වතුන් මඩුල්ලක් ඉදිරියේ ඉදිරිපත් කර අනුමැතිය ලබාගත් බවත්, මාස 06 කට වරක් මෙම විද්වතුන් මඩුල්ල ඉදිරියේ මෙම පර්යේෂණයේ ප්‍රගතිය ඉදිරිපත් කර ඒ ගැන සාකච්ඡාවට බඳුන් වූ බවත් අධ්‍යක්ෂ (පලතුරු පර්යේෂණ හා සංවර්ධන) විසින් මා වෙත දන්වා තිබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් ආහාර බෝග නිෂ්පාදනය සඳහා දේශගුණික අනුවර්ථිත හරිත තාක්ෂණය නංවාලීමේ විශේෂ ව්‍යාපෘතියක් මුල් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය වෙත රු. මිලියන 25 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද සාමාන්‍ය ක්‍රියාකාරකම් සඳහා එම ප්‍රතිපාදන වැයකර තිබුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටු කිරීමට හැකිවන පරිදි සැළසුම් සකස් කර ක්‍රියාවට නැංවිය යුතු වීම. | ජල සම්පාදන පද්ධතියක් ප්‍රමුඛ අවශ්‍යතාවයක් වූ නිසාත්. ආයතනයට ලැබෙන සාමාන්‍ය ප්‍රතිපාදන ඒ සඳහා ප්‍රමාණවත් නොවන බැවින් මෙම විශේෂ ව්‍යාපෘතිය මඟින් එය සිදුකිරීමට තීරණය කර ඇත. |
| (ඇ) | 2018 වර්ෂය සඳහා උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය වෙත වෙන්කර තිබූ රු.මිලියන 30 ක මුළු ප්‍රතිපාදනයෙන් සියයට 70 ක් ස්ථාන 07 ක රසායනාගාර පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් වෙන්කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූ දේශගුණික වෙනස්වීම් නොසළකා වර්ෂය පුරාම අඛණ්ඩ සැපයුමක් ඇති කිරීම සඳහා එළවළු නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සැලැසුම් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | අධ්‍යක්ෂ (උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන) වෙතින් කරුණු විමසා ඇත. පිළිතුරු ලද පසු විගණනයට ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වාසිටිමි. |

### 3.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික බීජ නිෂ්පාදනය හා මිලදී ගැනීමේ වැඩසටහන යටතේ 2018 වර්ෂයේදී මිලදී ගැනීමට අපේක්ෂිත සම්මත එළවළු බීජ ප්‍රමාණය කි.ග්‍රෑ.20,000 ක් වුවත් වර්ෂය අවසානයේ ළඟා කරගෙන තිබුණේ සියයට 67 ක් හෙවත් කි.ග්‍රෑ.13,418 ක් ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | සමහර භෝගවල අතිරික්ත තොග පැවතීම නිසා මිලදී ගැනීම අඩු කළ අතර අයහපත් කාලගුණය නිසා මිලදී ගත හැකිව තිබූ බීජ ප්‍රමාණය අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු විය |
| (ආ) | මිරිස් භෝගයේ ජාතික බීජ අවශ්‍යතාවය ආනයන මඟින් හෝ දේශීය සැපයුම මඟින් මුළු අවශ්‍යතාවය නොසැපිරෙන බැවින් අවශ්‍ය වන අනෙකුත් බීජ ප්‍රමාණයන් ගොවීන් විසින් ස්වයංව සපුරා ගන්නා අතර මෙම බීජ ගුණාත්මක බීජ නොවීමට ඇති ඉඩකඩ ඉහළ බැවින් ඒ තුළින් ගොවියාට | රටේ අවශ්‍යතාවයට ගැලපෙන බීජ අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් නිපදවීමට දෙපාර්තමේන්තුවේ සම්පත්මෙහෙයවීම සිදු කළ යුතු වීම. | ජාතික මිරිස් බීජ අවශ්‍යතාවයෙන් සියයට 25 ක් සැපයීම අරමුණු කර ගෙන ඇති බවත් දැනට මිරිස් කි.ග්‍රෑ.800 ක් පවතින බවත් ඉදිරියේදි ඒවා නිකුත් කිරීමට කටයුතු කරනුලැබේ. |

| | | | |
|---|---|---|---|
| | හොඳ අස්වැන්නක් ලබා ගැනීමට ඇති ඉඩකඩ ඇහිරී තිබුණි. | | |
| (ඈ) | දේශීය බීජ අර්තාපල් නිෂ්පාදනය වැඩි කිරීමට පවතින බාධාවන් හඳුනා ගෙන විකල්ප අවස්ථා තුළින් බීජ අර්තාපල් නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | පර්යේෂණයන් සිදුකර නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතු වීම. | නිසි ක්‍රමවේද අනුගමනය කරමින් අවශ්‍ය පරිදි නියාමනය සිදු කර ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ ප්‍රචලිත දොඩම් ප්‍රභේද තුනෙන් පසුගිය වර්ෂ 05 ක කාලය තුළදි ක්ෂේත්‍රයට මුදාහැර තිබූ පැළ ප්‍රමාණය ඉතා පහළ අගයක් ගෙන තිබුණු අතර ඒ අනුව ව්‍යාප්ති අංශයෙන් ඉටු වී ඇති කාර්යභාරය ප්‍රමාණවත් නොවූ බව නිරීක්ෂණය විය. ඊට අමතරව හොරණ එහීම් 1, 2. 3 යන ජම්නාරං ප්‍රභේදයන් සම්බන්ධ පර්යේෂණයන් 2006 වර්ෂයේ ආරම්භ කර 2013 වර්ෂයේ නිම කර තිබුණද එම පර්යේෂණයේ ප්‍රතිඵලය ක්ෂේත්‍රයට ගලා නොයෑම තුළ ඊට අදාළව දරන ලද වියදම් නිෂ්කාර්ය වීතිබුණි. | පර්යේෂණවල ප්‍රථිඵල ක්ෂේත්‍රගත නොවීමට හේතු සොයා බලා එම පර්යේෂණ සංවර්ධනය කර පවත්වා ගෙන යාමට ක්‍රියා කළ යුතු වීම. | අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන) වෙතින් වෙතින් පිළිතුරු විමසා ඇතත්, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. |
| (ඉ) | හොරණ පලතුරු පර්යේෂණ ආයතනය විසින් ''හොරණ පපායා'' නමින් නවදේශීය දෙමුහුන් ප්‍රභේදයක් සම්බන්ධ පර්යේෂණ කටයුතු 2002 වර්ෂයේ ආරම්භ කර 2014 වර්ෂයේදී නිදහස් කර තිබුණි. පර්යේෂණ ප්‍රතිඵලය ක්ෂේත්‍රයට ව්‍යාප්ත කිරීමට දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බැවින් වර්ෂ 04 ක් තුළ මෙම ප්‍රභේදයෙන් බීජ නිෂ්පාදනයට දායකත්වය කි.ග්‍රෑ.3.38 ක් පමණක් වී තිබුණි. | -එම- | ආනයනික දෙමුහුම් ප්‍රභේද සමඟ ඇති තරඟකාරිත්වය හේතුවෙන් මෙම ප්‍රභේදයේ ව්‍යාප්තිය තරමක් සෙමෙන් සිදුවේ. |
| (ඊ) | වීරවිල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් පසුගිය වර්ෂ 10 තුල බීජ ප්‍රභේද නිදහස් කර නොතිබූ අතර සිදු කරන පර්යේෂණ බොහොමයක් අත්හදා බැලීම් හා ඇගැයීම වැනි ක්ෂේත්‍ර කෙරෙහි යොමු වී තිබුණි. | ප්‍රාදේශීය ගොවි ගැටළු හඳුනාගෙන ඒ සඳහා ක්ෂණික හා ස්ථිර විසඳුම් ලබාදිය හැකිවන පරිදි පර්යේෂණ සැලැස්මක් සකස් කර නිලධාරීන් ඒ සඳහා යොමු කළ යුතු වීම. | ගොවීන්ගේ කාලීන ගැටළු හඳුනාගැනීම සඳහා මෑත කාලයේදී යලිත් ආරම්භ කරන ලද පර්යේෂණ හා ව්‍යාප්ති අංශයන් අතර සංවාදය තුළින් පර්යේෂණ අංශයත්, කෘෂිකර්ම ව්‍යාප්ති අංශයත් සමඟ සාකච්ඡා කර කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන්, ගොවීන් සහ විශ්ව විද්‍යාලවල සිසුන් වෙනුවෙන් නව තාක්ෂණය සමඟ මුසු වූ පුහුණු වැඩ සටහන් දියත් කිරීම බිබිල උද්‍යාන භෝග පුහුණු හා සංවර්ධන ආයතනයේ මූලික අරමුණක් වුවද අදාළ පුහුණු කිරීම්වල ප්‍රගතිය පසුගිය වර්ෂ 05 තුළ සියයට 41 ත් සියයට 69 ත් අතර පරාසයක පැවතුනි. | නිලධාරින්ගේ හා ගොවීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පුහුණු වැඩ සටහන් නියමිත පරිදි පැවැත්විය යුතු වීම. | උද්‍යාන භෝග පුහුණු හා සංවර්ධන ආයතනය මඟින් රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන්, ගොවීන් සහ විශ්ව විද්‍යාලවල සිසුන් වෙනුවෙන් නව තාක්ෂණය සමඟ මුසුවූ පුහුණු වැඩසටහන් දියත් කිරීම මූලික අරමුණක් වේ. |
| (ඌ) | පලතුරු ගම්මාන වැඩසටහන යටතේ පරීක්ෂාවට භාජනය කළ ගම්මානවලින් ලබාගත් සාර්ථක පැළ ප්‍රමාණය සියයට 06 ත් සියයට 49 ත් අතර පරාසයක පැවති බැවින් අපේක්ෂිත අරමුණු කරා යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට ආයතනයේ භෞතික හා මානව සම්පත් ඵලදායීව යොදා ගත යුතු වීම. | සාර්ථක පැළ ප්‍රමාණයේ ප්‍රගතිය සියයට 6 ත් සියයට 49 ක් අතර පරාසයක පැවතියද, සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය මඟින් සිදුකර ඇති පසු විපරම් වාර්තාවේ ප්‍රගතිය ඊට වඩා ඉහළ අගයක් ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.5 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2002 වර්ෂයේ විවිධ කෙසෙල් ප්‍රභේදයන් පර්යේෂණ ක්ෂේත්‍රයේ සිටුවා වර්ෂ 07 ක් පමණ ඇගැයීමකට ලක්කර 2010 වර්ෂයේ මිල්ලෑව සුවඳැල් නමින් ප්‍රභේදයක් නිදහස් කර තිබුණද 2010 වර්ෂයේ සිට 2018 ඔක්තෝබර් දක්වා මෙම ප්‍රභේදයෙන් ක්ෂේත්‍රයට බෙදා හැර තිබූ පැළ සංඛ්‍යාව 763 ක් පමණක් විය. | පර්යේෂණවල ප්‍රතිඵල ක්ෂේත්‍රගත නොවීමට හේතු සොයා බලා එම පර්යේෂණ සංවර්ධනය කර පවත්වා ගෙන යාමට ක්‍රියා කළ යුතු වීම. | සංරක්ෂණය කර තබාගන්නා මිල්ලෑව සුවඳැල් මව් ශාකවලින් වරින් වර 2018 නොවැම්බර් 16 දින දක්වා පැළ 600 ක් පමණ ගොවීන්ට බෙදාහැර ඇත. |
| (ආ) | හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය යටතේ "ඉංදු" ජම්බාරං ප්‍රභේදය පර්යේෂණ කටයුතු 2002 වර්ෂයේ ආරම්භ කර 2009 වර්ෂයේ නිදහස් කර තිබුණි. 2015 වර්ෂයට සාපේක්ෂව 2016, 2017, හා 2018 වර්ෂවල පිළිවෙළින් සියයට 79 ක්, සියයට 22 ක් හා සියයට 04 ක් දක්වා නිෂ්පාදනය අඩුවන තත්ත්වයක් පෙන්නුම් කර තිබුණු අතර ඊට හේතුව | -එම- | අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන) වෙතින් පිළිතුරු විමසා ඇතත්, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. |

| | | | |
|---|---|---|---|
| | විගණනයට තහවුරු නොවීය. | | |
| (ඇ) | හොරණ පලතුරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය යටතේ "හොරණ ජූෂි" ජමනාරං ප්‍රභේදය 2004 වර්ෂයේ පර්යේෂණය ආරම්භ කර2017 වර්ෂයේ නිදහස් කර තිබුණු අතර බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයට පැළ 150 ක් ලබාදී තිබුණ ද ක්ෂේත්‍රයට පැළ බෙදාහැර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 1979 ආරම්භ කළ බිබිල දොඩම් පර්යේෂණ ආයතනය 1989 වර්ෂයෙන් පසුව පර්යේෂණ නිලධාරියෙකු නොමැතිව පර්යේෂණ සහකාර නිලධාරියෙකු යටතේ පවතින අතර ජාතික අවශ්‍යතාවයන් ඉටු වන පරිදි ආයතනය කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ මධ්‍යස්ථානය ගොවි ගැටළුවලට පිළියම් යෙදීම සඳහා ක්‍රියා කළ යුතු වීම. | පර්යේෂණ නිලධාරීන් බඳවා ගත් විගස මෙම මධ්‍යස්ථානයට පර්යේෂණ නිලධාරියෙකු අනුයුක්ත කිරීමට කටයුතු කරන බව. |
| (ඉ) | උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී F8 ව්‍යාපෘතිය මගින් රු.මිලියන 93.9 ක් වැය කර පාංශු පර්යේෂණ විද්‍යාගාර 21 ක් ස්ථාපිත කර තිබුණි. එයින් මොණරාගල අන්තර් පළාත් කාර්යාලය වෙනුවෙන් රු.මිලියන 4.47 ක ද්‍රව්‍ය හා උපකරණ සපයා තිබුණ ද 2018 සැප්තැම්බර් 07 දින වනවිටත් පස් සාම්පල් පරීක්ෂා කර ගොවියා වෙත හෝ කෘෂිකර්ම කාර්යාල වෙත තාක්ෂණ උපදේශ හෝ නිර්දේශ ලබා දී නොතිබුණි. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි සම්පත් මෙහෙයවීම සිදු කළ යුතු වීම. | 2018 අගෝස්තු 23 දින වන විට පාංශු සාම්පල 15 ක පරීක්ෂණ අවසන් කර ප්‍රතිඵල ලබාගෙන අවසන්ව පැවතුණි.<br>2018 ඔක්තෝබර් 11 දින නිල වශයෙන් පාංශු පර්යේෂණාගාරය විවෘත කර ඇති බවත් අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු) විසින් මා වෙත දන්වා ඇත. |
| (ඊ) | සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පර්යේෂණ නිලධාරීන් විසින් පසුගිය දශක 04 ක පමණ කාලය තුළදී පර්යේෂණ සිදු කර බීජ අර්තාපල් ප්‍රභේද 06 ක් නිකුත් කර තිබුණ ද මෙම ප්‍රභේද පාරිභෝගිකයා හා ගොවියා අතරට ගොස් නොතිබුණි. | පර්යේෂණවල ප්‍රතිඵල ක්ෂේත්‍රගත නොවීමට හේතු සොයා බලා එම පර්යේෂණ සංවර්ධනය කර පවත්වා ගෙන යාමට ක්‍රියා කළ යුතු වීම. | වර්ෂයක් තුළ විදේශීය අර්තාපල් ප්‍රභේද 10 ක් පමණ අත්හදා බැලීම් සිදුකළද, ගොවි ජනතාව තවමත් ග්‍රැනෝලා අර්තාපල් ප්‍රභේදය වගා කරයි. මෙම කරුණු සැළකිල්ලට ගෙන ගැමා විකිරණ යොදාගනිමින් විශේෂ අර්තාපල් අභිජනන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. |
| (උ) | ගන්නෝරුව උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය | නව තාක්ෂණික ප්‍රතිඵල ඵලදායීව උපයෝජනය | ඉදිරිපත් වූ එකඳු නව තාක්ෂණයක්වත් නිදහස් |

| | | | |
|---|---|---|---|
| | විසින් වගා මාධ්‍යයක් ලෙස කොහුබත් වෙනුවට ෆයිනස් කොළ යොදා ගැනීමේ වගා තාක්ෂණය 2010 වර්ෂයේදී නව තාක්ෂණය එළි දැක්වීමේ කමිටුවට ඉදිරිපත් කළද 2018 දෙසැම්බර් වන විටත් වගා තාක්ෂණය නිදහස් වී නොතිබුණි. මේ හේතුවෙන් ෆයිනස් කොළ යොදා ගැනීම පිළිබඳ තාක්ෂණය, කෘෂි කර්මාන්තයට හඳුන්වා දීමට නොහැකි වී තිබුණි. | කිරීමට කටයුතු කළ යුතු වීම. | කිරීමට අදාළ කමිටුවෙන් අනුමැතිය ලැබී නොමැත |
| (ඌ) | හොරණ පලතුරු භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් රු.මිලියන 01 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන පැනමා රෝගයට ප්‍රතිරෝධීන් වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය තුළින් කෙසෙල් වගාවේ යෙදෙන ගොවීන් මුහුණ දෙන මූලික ගැටලුවට පිළියම් යෙදීමට පර්යේෂණ නිලධාරින්ගේ අවධානය යොමු වී නොතිබුණි. | ගැටළු නිරාකරණය කිරීමට අවශ්‍ය පර්යේෂණයන් සිදු කිරීමට ක්‍රියා කළ යුතු වීම. | පටක රෝපිත කෙසෙල් පැළ සඳහා ලබාදෙන ගැමා කිරණවල තීව්‍රතාවය වෙනස්කර අදාළ පර්යේෂණ ඉදිරියේදී කරගෙන යාමට පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. |
| (එ) | ගන්නෝරුව එළවළු බීජ මධ්‍යස්ථානයේ බීජ තොග ලැබීම්වලට සාපේක්ෂව නිකුත් කිරීම් ඉතා අවම අගයක් ගෙන තිබුණු අතර වර්ෂ 4 ක් පමණ ඉක්මයාම නිසා ප්‍රරෝහණ අවධානමක් සහිත විවිධ වර්ගයේ බීජ කි.ග්‍රෑ.2,080 ක තොගයක් 2018 දෙසැම්බර් 31 දින වනවිට ඉතිරිව පවතින බව නිරීක්ෂණය විය. | අවශ්‍යතාවයන් හඳුනාගෙන ඒ අනුව බීජ නිෂ්පාදනය හා මිලදී ගැනීම සිදුකළ යුතු වීම. | අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන) වෙතින් පිළිතුරු විමසා ඇත. |
| (ඒ) | කුණ්ඩසාලේ රජයේ බීජ ගොවිපලෙහි බී ලූනු නිෂ්පාදනය කිරීමේ අරමුණින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.මිලියන 6.55 ක් වැයකර 2014 වර්ෂයේදි ඉදිකර තිබුණු වැසි ආවරණ 05 ක් 2016/2017 මහ කන්නයෙන් පසු එම අරමුණ උදෙසා භාවිතා කර නොතිබුණි. | අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීමට සම්පත් ඵලදායීව හා කාර්යක්ෂමව මෙහෙයවිය යුතු වීම. | අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍යසංවර්ධන) වෙතින් පිළිතුරු විමසා ඇතත්, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. |

**3.6 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) එළවළු පළිබෝධකයින් පාලනය | ව්‍යාපෘතිය මඟින් | අධ්‍යක්ෂ බීජ සහතික කිරීම හා |

| | | | |
|---|---|---|---|
| | සඳහා ජෛව විද්‍යාත්මක පළිබෝධ පාලකයින් යොදා ගැනීමේ ව්‍යාපෘතියක් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 17 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර පරිපාලන හා ක්ෂේත්‍ර පර්යේෂණ වියදම් වශයෙන් රු.1,145,000 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 6.74 ක් පමණක් උපයෝජනය කර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | බලාපොරොත්තු වන අරමුණු හා ඉලක්ක ඉටු කර ගැනීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගත යුතුවීම. | පැළෑටි සංරක්ෂණවෙතින් පිළිතුරු විමසා ඇතත්මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. |
| (ආ) | මිල අධික එළවළු දේශීය හා විදේශීය වෙළෙඳපළට සැපයීම යන මූලික අරමුණින් යුතුව ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය (2017-2020) වැඩ සටහනේ ප්‍රතිපාදන යටතේ අර්ධ ස්වයංක්‍රීය ආරක්ෂිත ගෘහ 40 ක් ඉදිකිරීම හා සපයා සවි කිරීමේ ව්‍යාපෘතියක් මුදල් රෙගුලාසි 03 (2) හි විධිවිධාන අනුගමනය නොකර සකස් කර තිබුණු අතර 2018 දෙසැම්බර් වනවිට ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | ව්‍යාපෘතිය මඟින් බලාපොරොත්තු වන අරමුණු හා ඉලක්ක ඉටු කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | මෙම ව්‍යාපෘතිය අත්හැර දමන ලද්දේ කොන්ත්‍රාත්කරු විසිනි. එයට ප්‍රධානතම හේතුව වූයේ රජයටත්, සැපයුම්කරුවන්ටත් පුරෝකථනය කරගත නොහැකි වූ මට්ටමේ අනපේක්ෂිත ලෙස ඩොලරයේ වටිනාකම ඉහළයාම වේ. |
| (ඇ) | ඉංජිනේරු අංශය මඟින් 2018 වර්ෂයේ ක්‍රියාවට නංවන ලද හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද වටිනාකම රු. මිලියන 15.48 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 11 ක් නිම කිරීමකින් තොරව අවලංගු කර තිබුණි. | සැලසුම් කළ පරිදි ඉදිකිරීම් නියමිත කාලය තුල නිම කිරීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

**3.7** **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | මොණරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මඟින් සමාලෝචිත වර්ෂයේදී හෙක්ටයාර් 20 ක වගා භූමියක් සඳහා අඹ පැළ ලබාදීමට හා හෙක්ටයාර 04 ක් සඳහා වැල් දොඩම් පැළ ලබාදීමට සැලසුම් කර තිබුණද 2018 සැප්තැම්බර් 07 දින වනවිටද එම වගාවන් ක්ෂේත්‍රයේ | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි ආයතනයේ නිලධාරීන් කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවිය යුතු වීම. | ගොවීන් තේරීම සඳහා සාධාරණ කාලයක් නිලධාරීන් වෙත ලබාදිය යුතු බැවින්ද, ඒ වන විට ප්‍රදේශයේ කාලගුණික තත්ත්වය බෝග සංස්ථාපනයට සුදුසු නොවූ බැවින්ද යම් කාලයක් මේ සඳහා ගතවී ඇත. |

පිහිටුවා නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ආ) | වටිනාකම රු.මිලියන 60.47 ක් වූ කොන්ත්‍රාත් 40 ක ඉදිකිරීම් කටයුතු නියමිත දින හෝ ඊට පෙර නිම නොකිරිම හා රු.මිලියන 32.41 කට කොන්ත්‍රාත් වටිනාකමකට අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත් 18 ක කටයුතු නිම කළයුතු දිනයන් නිශ්චිතව දක්වා නොතිබීම මත එම ව්‍යාපෘති මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගෙන නොතිබුණි. | සැලැසුම් කළ පරිදි ඉදිකිරීම් නියමිත කාලය තුළ නිම කිරීමට කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් මගේ අංක ප්‍රධාන ඉංජිනේරු සහ සහකාර අධ්‍යක්ෂ ප්‍රගති මෙහෙයුම් වෙතින් පිළිතුරු විමසා ඇතත්, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. |

**3.8** **කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2018 වර්ෂයේ ඉංජිනේරු අංශය මඟින් ක්‍රියාවට නංවන ලද වටිනාකම රු.මිලියන 159.74 ක් වූ කොන්ත්‍රාත් 83 ක ඉදිකිරීම් වැඩ කාල පමාවකින් පසුව ආරම්භ කර තිබුණි. මීට අමතරව ඉදිකිරීම් කොන්ත්‍රාත් 24 ක වැඩ ආරම්භ කළ දිනයන් නිශ්චිතව දක්වා නොතිබූ අතර නියමිත දිනට වැඩ ආරම්භ කර නොතිබූ කොන්ත්‍රාත් 22 ක දින දීර්ඝ කිරීම් ද ඇතුළුව ගිවිසුම් ප්‍රකාරව කටයුතු නිමකර නොතිබුණි. | සැලැසුම් කළ පරිදි ඉදිකිරීම් නියමිත කාලය තුළ නිම කිරීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

**3.9** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභා ගතකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

**3.10 ප්‍රසම්පාදනයන්**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවට අයත් ආපනශාලා 03 ක් බදු දීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකර සුභ සාධක සංගම් වෙත ලබා දී තිබූ අතර ආපනශාලාවලින් ලද ආදායම සංගමයේ අරමුදලට බැරකර තිබුණි. | රජයේ දේපල බදු දීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය ඔබටද පිටපතක් සහිතව සියළු අධ්‍යක්ෂවරුන් දැනුවත් කර තිබේ. |
| (ආ) | සීතාඑළිය බිජ අර්තාපල් ගොවිපළෙහි පොලිතීන් ගෘහවල බිම සිමෙන්ති ඇතිරීම සඳහා වටිනාකම රු.3,630,000 කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | වගකීමෙන් යුතුව නිශ්චිත සාධක සහිතව පිළිතුරක් එවන ලෙස ම විසින් ප්‍රධාන ඉංජිනේරු වෙත දන්වා ඇත. |
| (i) | අනුමත ඉංජිනේරු ඇස්තමේන්තුව හා ලංසු වටිනාකම අතර සියයට 23.12 එනම් රු.1,091,738ක වෙනසක් නිරීක්ෂණය වුවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් විස්තරාත්මක ලංසු ඇගැයීමක් සිදුකර නොතිබුණි. | ක්ෂේත්‍රය අදාළ වැඩබිම පරීක්ෂා කර නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (ii) | ඇස්තමේන්තුවේ විෂයය අංක 02 යටතේ මි.මි. 40 ඝනකමට වර්ග මීටර් 6,000 ක් කොන්ක්‍රීට් ඇතිරීම සිදු කළ යුතු වුවද භෞතික පරීක්ෂා කිරීම අනුව අනුමත පිරිවිතරයට අනුකූල නොවන ලෙස ඉදිකිරීම් නිම කර තිබුණු අතර ඉංජිනේරු සහකාරවරයා විසින් වැඩ බිම් පරීක්ෂා කර විෂය පථය වෙනස් කර තිබුණ ද ඒ සඳහා විධිමත් හා ලිඛිත අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | පිරිවිතර වලට අනුකූලව අදාළ කාර්යයන් ඉටු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (iii) | පොලිතීන් ගෘහ කිහිපයක සිමෙන්ති බදාමේ පැවතිය යුතු ඝනකම මි.මි. 05 ක් අඩුවෙන් යෙදීම මත මීටර් 4,000 ක ඉටු නොකරන ලද වැඩ සඳහා රු. 265,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | ගෙවීම් කිරීමට පෙර අදාළ කාර්යයන් නිසි පරිදි ඉටුකර ඇති බවට සහතික වීම හා වැඩියෙන් කරන ලද | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | ගෙවීම් අය කර ගත යුතු වීම. | |
| (iv) | ප්‍රසාරණ මූට්ටු නිශ්චිත පරාසයන්ගෙන් යොදා නොතිබීම හේතුවෙන් ඉදිකිරීම සිදුකර මසක් ඇතුළත සිමෙන්ති ඇතුරුම පුපුරා ගොස් තිබුණි. | ප්‍රමාණ බිල්පත්‍ර (BOQ) නිවැරදිව සකස් කළයුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | ඉදිකිරීම් කොන්ත්‍රාත් 05 ක ට අදාළව එකතුව රු.4,686,467 ක් හෙවත් සියයට 61 ක වැඩ නිම නොකර ඉවත්ව තිබුණු කොන්ත්‍රාත්කරුවෙකු අසාධු ලේඛන ගත කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ලංසු ඇගැයීම සිදු කර වඩාත් සුදුසු කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සිදුකළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වැඩ විෂයයන් 05 ක ට අදාළව විගණන නියැදි පරීක්ෂාව අනුව කොන්ත්‍රාත්කරුගේ අධි ගාස්තුව හා ප්‍රමාද ගාස්තු ලෙස රු.576,634 ක් රජයට අය විය යුතු බව නිරීක්ෂණය විය. | රජයට අය විය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඉ) | සීතාඑළිය ගොවිපලේ නව ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 6.27 ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ. | | |
| (i) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 මාර්ගෝපදේශයට පටහැනිව රු. මිලියන 4.6 ක ප්‍රතිපාදන මුදල ඉක්මවා රු.මිලියන 1.67ක් වැඩියෙන් ඉංජිනේරු ඇස්තමේන්තුව පිළියෙල කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2018 මාර්තු 28 දිනැතිව අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍යය සංවර්ධන) වෙතින් සහ ප්‍රධාන ඉංජිනේරු වෙතින් පිළිතුරු විමසා ඇත. |
| (ii) | ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා ලංසු වටිනාකම සියයට 24.74 ක් හා වැඩ විෂයයන් 32 කට අදාළ රේටයන් සියයට 23 සිට සියයට 56 දක්වා ඉහළ පරාසයක පැවති අතර මෙහිදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී පලපුරුද්ද, හැකියාව හා ධාරිතාවය පිළිබඳ සළකා බලා කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුතු වීම. | -එම- |
| (iii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7:10 අනුව | -එම- | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට හැකියාව හා ධාරිතාවය තිබෙන බව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තීරණය කළයුතු වුවත් ලංසු ඇගයීමේදී අවම ලංසු මිල පිළිබඳව වැඩි අවධානයක් යොමු කර ලංසුකරු තෝරාගෙන තිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත්කරු මෙම කොන්ත්‍රාත් කටයුත්තේ කොටසක් පමණක් ඉටුකර අතහැර දමා තිබුණි. | | |
| (iv) | අනුමත ඉංජිනේරු ඇස්තමේන්තු ව අනුව මි.මි 225 ඝණකමින් යුත් මැටි ගඩොල් බැදීම වෙනුවෙන් රු.900,819 ක් ගෙවා තිබුණද ඒ සඳහා මැටි ගඩොල් භාවිතා කර තිබුණි. | ප්‍රමාණ බිල්පත්‍ර ප්‍රකාරව ඉදිකිරීම් සිදුකළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (v) | නියමිත ඝනකම හා ප්‍රමිතිය නොමැතිව පොළොව කොන්ක්‍රීට් කර තිබියදී රු.121,918 ක් වූ සම්පූර්ණ මුදල ගෙවා තිබුණි. | ගෙවීම් කිරීමට පෙර අදාළ කාර්යයන් නිසි පරිදි ඉටු කර ඇති බවට තාක්ෂණික නිලධාරියා පරීක්ෂා කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.11 වත්කම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පහත වර්ග කර ඇති වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුව සතු වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| ගොඩනැගිලි | 99 | වසර 3 ටවැඩි |
| -එම- | 25 | වසර 01 ට වැඩි වසර 03 ට අඩු |
| මෝටර් වාහන | 124 | වසර 3 ටවැඩි |
| යන්ත්‍ර සූත්‍ර | 342 | වසර 3 ටවැඩි |

| | | | |
|---|---|---|---|
| | -එම- | 37 | වසර 01 ට<br>වැඩි 03 අඩු |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් සම්බන්ධව සිදු කරන ලද නියදි පරීක්ෂාවේදී ආයතන 6 ක ඉඩම් හෙක්ටයාර් 100 ක් නිත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව භුක්ති විඳින සියළුම ඉඩම් නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | අයිතිය පැවරීමට අදාළ කටයුතු සිදු කරගෙන යනුලැබේ. |
| (ඇ) | හොරණ පලතුරු භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සතු බිම් ප්‍රමාණයෙන් අක්කර 2.15 ක පමණ කොටසක් අනවසර පදිංචිකරුවන් විසින් අල්ලාගෙන තිබුණද මෙම ඉඩම් නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව භුක්ති විඳින සියළුම ඉඩම් නිරවුල් කර ආරක්ෂාව තහවුරු කර ගත යුතු වීම | මේවනවිට හොරණ ප්‍රාදේශීය ලේකම් සමඟ සම්බන්ධ වී අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඉඩම පවරාගැනීමේ කටයුතු සිදුකරමින් සිටින බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඈ) | 2000 දෙසැම්බර් 14 දින පෞද්ගලික ආයතනයකින් රු.987,188 කට මිලදී ගන්නා ලද Hersonber වර්ගයේ බීජ පැකට් කිරීමේ යන්ත්‍රය මිලදී ගත් දින සිට මාස 07 කින් පසු භාවිතයෙන් ඉවත් කර තිබුණි. | ආයතනය සතු වත්කම් උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතු වීම. | අධ්‍යක්ෂ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන වෙතින් පිළිතුරු විමසා ඇතත්, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. |
| (ඉ) | කුණ්ඩසාලේ ගොවිපළ සතුව වගා කළ හැකි භූමි ප්‍රමාණය හෙක්ටයාර් 26.5 ක් පැවතියද 2017 යල, 2017/2018 මහ හා 2018 යල කන්නවල පිළිවෙලින් හෙක්ටයාර් 9.02, 4.26, හා 11.69 ක් ලෙස අඩු භූමි ප්‍රමාණයක් වගා කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. | -එම- | -එම- |

**3.12 පාඩු හා හානි**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 මාර්තු 16 දින සිදු වූ කැබ් රථ අනතුර සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයෙන් ඇස්තමේන්තු කර තිබූ රු.119,250 ක හානිය පිළිබඳ අවසන් පරීක්ෂණයක් 2018 ජූනි 06 දින වන විටත් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වහාම අදාළ පරීක්ෂණ මණ්ඩලය පත්කර ඉදිරි කටයුතු සිදුකරන ලෙස මවිසින් අධ්‍යක්ෂ (පාලන) වෙත දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වාහන අනතුරු 02 කට අදාළව හිමිකම් නොපෑමේ දීමනාවේ වූ එකතුව රු.24,873 ක් අනතුරට වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව මගේ අංක කෘදෙ/මු/8/6/2018/23 හා 2019 මැයි 24 දින ලිපිය මඟින් උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) | ගව ලේඛනය අනුව වර්ග 4 කට අයත් ගවයන් 14 දෙනෙකුගේ ඌනතාවයක් හඳුනාගෙන තිබූ අතර එම ඌනතාවයන්ට හේතු පරීක්ෂාකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණයන් සිදු කර අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ගව ලේඛනයේ වූ ගවයින් 14 දෙනාගේ ඌණතාවය සම්බන්ධයෙන් මේවන විට පරීක්ෂණ ආරම්භ කර ඇති බව අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු) විසින් මා වෙත දන්වා ඇත. |
| (ඈ) | 2003 වර්ෂයේදී උද්‍යාන භෝග පුහුණු හා සංවර්ධන ආයතනය පිහිටුවන අවස්ථාවේදී උද්‍යාන විද්‍යා පර්යේෂණ ගොවිපළ යටතේ පැවති ගබඩාවේ එළදා විෂයයන් 58 කට අදාළ කිලෝග්‍රෑම් 3883 යි ග්‍රෑම් 610 ක ප්‍රමාණයක් හා එළදා විෂයයන් 25 කට අදාළ බීජ පැකට් 394 ක ඌනතාවයක් හඳුනා ගෙන තිබුණද 2018 අගෝස්තු 28 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණයන් සිදු කර අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඌනතා හඳුනාගෙන ඇති ගබඩාවේ වූ එළදා අයිතමයන්ට අදාළව මුදල් රෙගුලාසි පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සිදුකෙරෙමින් පවතින බව අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු) විසින් මා වෙත දන්වා ඇත. |
| (ඉ) | බිබිල උද්‍යාන භෝග පුහුණු හා සංවර්ධන ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛන අනුව පසුගිය වර්ෂ 05 ක් තුළ හඳුනාගෙන තිබුණු , කල් ඉකුත් වී සතුන් විසින් විනාශ කර තිබූ බීජ කිලෝග්‍රෑම් 793 යි ග්‍රෑම් 150 ක් සම්බන්ධයෙන් 2018 අගෝස්තු වනවිටත් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ සිදු කර අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම | අධ්‍යක්ෂ ව්‍යාප්ති හා පුහුණු වෙතින් පිළිතුරු විමසා ඇතත්, ඒ සඳහා පිළිතුරක් ලැබී නොමැත. |
| (ඊ) | පැළෑටි සංරක්ෂණ සේවයට අයත් කැබ් රථය 2011 නොවැම්බර් 23 දින අනතුරට ලක්වීම සම්බන්ධයෙන් වූ අලාභය රු.110,143 ක් මුදල් රෙගුලාසි 105 ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට 2019 පෙබරවාරි 5 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම | අධ්‍යක්ෂ බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණවෙතින් පිළිතුරු විමසා ඇතත්, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (උ) | පලතුරු පැළ හා එළවළු බීජ බඳුන්වලට අදාළ පැළ මැරී යාමේ ලේඛනය අනුව 2018 ජනවාරි 01 දින සිට 2018 නොවැම්බර් 30 දින දක්වා පැළ වර්ග 79 කට අදාළ එකතුව රු.758,027ක් වටිනා පැළ මිය ගොස් තිබුණ ද මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණයන් සිදු කර ඒ අනුව කටයුතු කළ යුතු වීම. | අධ්‍යක්ෂ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන වෙතින් පිළිතුරු විමසා ඇතත්, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත |
| (ඌ) | 2017 වර්ෂයේ තොග සමීක්ෂණ වාර්තා අනුව එකතුව රු.41,332,743 ක් වටිනා තොග, මුදල් රෙගුලාසි 104(03) පරීක්ෂණ මත පොතෙන් කපා හැරීමට කටයුතු කර තිබුණ ද නිසි දැක්මක්, සැලැස්මක්, හා අවශ්‍යතා නිසි පරිදි හඳුනා නොගෙන තොග රැස්කළ නිලධාරීන් සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන බීජ පැළ නිෂ්පාදනය සිදු කළ යුතු බව. | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට හා ඊට අයත් ප්‍රාදේශීය ඒකකවලට අදාළ වසර 01 සිට වසර 11 දක්වා කාලයක් ඉක්මවූ රු.4,132,212ක් වූ හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) අනුව පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදුකළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

**3.13 කළමනාකරණ දූර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉංජිනේරු වැඩපළවල් දෙකක් පවත්වාගෙන යනු ලැබුවද, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය සතු වාහන අළුත්වැඩියාවන් හා වාහනවාර සේවා කිරීම් බාහිර ආයතන මඟින් ඉටු කර ගෙන තිබුණු අතර 2017 වර්ෂයේ සිට 2018 ජූනි දක්වා අවස්ථා 39 කදී රු.869,235ක් දරා තිබුණි. | ඉංජිනේරු වැඩපළවල් මඟින් ඵලදායීව හා කාර්යක්ෂමව සේවාවන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අළුත්වැඩියාවන් සිදු කිරීම සඳහා හා වාර සේවාවන් සිදු කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගන්නා ලෙසට ප්‍රධාන ඉංජිනේරු වෙත උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | ගන්නෝරුව බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැලෙහි පවත්වාගෙන යනු | අතිරික්තතා හා ඌනතා හඳුනාගෙන | තවද විගණනය වෙත පැළ ඉදිරිපත් කිරීමේදී වර්ග මාරු වී |

| | | | |
|---|---|---|---|
| | ලබන ඵලදා ලේඛන අනුව පැළ ශේෂ හා භෞතික ශේෂ සැලකීමේදී රු.772,400 පැළ ඌනතාවයක් හා රු.51,000 ක් පැළ අතිරික්තයක් පැවතුනි. | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු වීම. | ඇති බැවින් ගණනය කිරීමේ දෝෂ ඇති බවත් එක් එක් පැළ වර්ගවල අතිරික්තතා හෝ ඌනතා නොමැත. |
| (ඇ) | බෝඹුවල වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ කටයුතු සිදුකරනු ලබන ක්ෂේත්‍රයේ වතුර බැස යාමට ඉදිකරන ලද ඇල මාර්ග විධිමත් පරිදි නඩත්තු කර නොතිබූ අතර එම ඇලවේලිවල ආක්‍රමණශීලී වල් පැළෑටි වන සැල්වීනියා හා ජපන් ජබර පැවතුණි. පර්යේෂණවල ප්‍රතිඵලය සඳහා මෙම පැළෑටි සෘජුවම බලපාන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු වී නොතිබුණි. | සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය නඩත්තු කටයුතු කාලීනව කළ යුතු වීම. | පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ඒවාට බාධාවක් නොවන පරිදි අවශ්‍ය අවස්ථාවලදී සැල්වීනියා සහ ජපන් ජබර ක්ෂේත්‍රයෙන් ඉවත් කරනු ලබයි. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ ආයතන 03 ක නිලධාරීන් 22 ක් ඉදිරි වැඩ සටහන් හා කළ වැඩ වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වැඩ සටහන් හා ඊට අදාළ කළ වැඩ වාර්තා නියමිත කාලය තුළ ඉදිරිපත් කළයුතු වීම. | නියමිත කාලය තුළ ඉදිරි වැඩ සටහන් හා කළ වැඩ වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |
| (ඉ) | ශ්‍රී ලංකාවේ දොඩම් වගාවේ පවතින ගැටළු හඳුනාගෙන ඒ අනුව පර්යේෂණ සැලැසුම් කර ක්‍රියාත්මක කර ගොවි ගැටළුවලට විසඳුම් ලබා ගැනීම තුළින් ගොවි ප්‍රජාව ශක්තිමත් කිරීමට මෙන්ම රටේ දොඩම් නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට හා දොඩම් ආනයන වියදම අවම කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව දෙපාර්තමේන්තුව සළකා බලා නොතිබුණු බව නිරීක්ෂණය විය. | දොඩම් වගාවේ පවතින ගැටළු හඳුනාගෙන ඒ අනුව පර්යේෂණ සිදුකිරීම මගින් දේශීය නිෂ්පාදනය ඉහළ නංවා ආනයන වියදම අඩු කර ගැනීමට කටයුතු කළයුතු වීම. | දැනට පර්යේෂණ මඟින් ලබා ඇති ප්‍රගතිය මත එම කලාපවල නැවත දොඩම් වගාව ප්‍රචලිතව පවතී.එම නිසා ඉදිරියේදී දේශීය දොඩම් නිෂ්පාදනය ඉහළ යනු ඇත. |
| (ඊ) | බිබිල උද්‍යාන භෝග පුහුණු හා සංවර්ධන ආයතනය විසින් පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, ප්‍රමාණවත් පුහුණු නිලධාරි පිරිසක් නොමැති වීම යනාදී ගැටළු හේතුවෙන් ආයතනය විසින් ලබා දෙන පුහුණුවීම් කාලීන අවශ්‍යතාවයට ගැලපෙන ඵලදායී පුහුණුවීමක් නොවන බව නිරීක්ෂණය විය. | පුහුණු මධ්‍යස්ථානය තුළ යටිතල පහසුකම් සංවර්ධනය, පුහුණු නිලධාරින් වැඩි කිරීම, ප්‍රමාණවත් පරිදි පුහුණු උපකරණ සැපයීම හා සිසුන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කළයුතු වීම. | පුහුණු උපකරණ ලබා ගැනීම, යටිතල පහසුකම් සංවර්ධනය, නේවාසිකාගාර ඉදිකිරීම, පුහුණු නිලධාරින් යෙදවීමට කටයුතු කරන බවත්, පුහුණු ලාභීන් සම්බන්ධ පසු විපරමක් සිදු කිරීම ප්‍රායෝගිකව අපහසුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සිටින ඇතැම් නිලධාරීන් පත්වීම් ලද දිනයේ සිට වසර 15 කට අධික කාලයක් එම ස්ථානයේම සේවයේ නියුක්තව ඇති බව නිරීක්ෂණය විය. | නිලධාරීන්ට විධිමත් පරිදි ස්ථාන මාරු ලබාදීමට කටයුතු කළ යුතු වීම. | මෙම නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් කර ඇත. |
| (ඌ) | ආනයනික බීජ සමඟ තරඟ කිරීමට හැකිවන පරිදි ගොවියාගේ අවශ්‍යතාවන්ට ගැලපෙන ලෙස පර්යේෂණ සැළසුම් කර දේශීය දෙමුහුන් බීජවලට ඇති ඉල්ලුම වැඩි කිරීමට ක්‍රියාකර නොතිබූ බව නිරීක්ෂණය විය. | දේශීය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි දෙමුහුන් එළවළු බීජ නිෂ්පාදනය සඳහා පර්යේෂණයන් සිදු කළ යුතු වීම. | උඩරට එළවළු වල බීජ අප රටේ නිෂ්පාදනය කල නොහැකි වන්නේ සුදුසු ස්වභාවික දේශගුණයක් අප රටේ නොමැතිවීමයි. දැනට මෙහි එළවළු වලින් දෙමුහුම් ප්‍රභේද 09 වගා කිරීම සඳහා නිදහස් කර ඇති අතර, මෙම ප්‍රභේද ගොවීන් අතර ජනප්‍රිය තත්ත්වයේ පවතී. |
| (එ) | දෙපාර්තමේන්තුව විසින් නුවරඑළිය මහ නගර සභාව සමඟ එක්ව කෘෂි සංචාරක ව්‍යාපෘතියක් සීතාඑළිය ගොවිපළ තුළ 2014 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර මේ නිසා ගොවිපලේ මාර්ග විශාල පාංශු ඛාදනයකට ලක්වීම, මාර්ගය දෙපස එක් පැත්තක මීටර් 1.5 ක පමණ දුරකට දූවිලි අංශු තැන්පත් වීම නිසා එම වගා ප්‍රදේශවල වර්ධනය අඩාලවීම, අර්තාපල්වලට පශ්චිම අංගමාරය හා පූර්ව අංගමාරය වැනි රෝග තත්ත්ව ඇතිවීම, බීජ ආකන්ද හට ගැනීම අඩුවීම, අර්තාපල් ශාක පත්‍ර මත කුඩා තෙල් පැල්ලම් ඇතිවීම හා බීජ අර්තාපල් නිෂ්පාදනය අඩු වීම සිදු වී තිබුණි. | ගොවිපලේ ප්‍රධාන අරමුණ බීජ අර්තාපල් නිෂ්පාදනය කිරීම වන අතර,<br><br>ඒ සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කළ යුතු වීම | අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන) වෙතින් පිළිතුරු විමසා ඇතත්, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත. |
| (ඒ) | පැල්වෙහෙර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) ඒකකයේ ගබඩාවල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම ඒකකයට අයත් බීජ කිලෝග්‍රෑම් 35,000 ක් සීතාඑළිය රජයේ බීජ නිෂ්පාදන ගොවිපලට අයත් ගබඩාවල තාවකාලිකව ගබඩා කර තිබුණි. මෙම බීජ තොගවලට මීයන් හා කෘමීන්ගෙන් හානි සිදු වී තිබූ අතර ඒ සඳහා දිගුකාලීන ආරක්ෂණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි. | නිෂ්පාදනය කරනු ලබන බීජ සුරක්ෂිතව ගබඩා කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු වීම. | -එම- |
| (ඔ) | සීතාඑළිය ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපලේ 2019 පෙබරවාරි 13 දින | රථ වාහන අළුත්වැඩියාවන් | -එම- |

| | | | |
|---|---|---|---|
| | වනවිට අළුත්වැඩියා කටයුතු සඳහා ලැබී මාස 01 සිට මාස 34 දක්වා කාලයක් ගත වී තිබුණු මෝටර් වාහන 14 ක් අළුත්වැඩියා කටයුතු අවසන් නොකර අංගනය තුළ රඳවා තිබුණි. | හැකි ඉක්මනින් සිදු කළ යුතු වීම. | |
| (ඕ) | කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපළේ 2017/2018 මහ කන්නයේ හා 2018 යල කන්නයේ ඉලක්කගත බීජ නිෂ්පාදනය සපුරා ගැනීම අවම මට්ටමක පැවති අතර මෙම ප්‍රගතිය ඉලක්කගත බීජ නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 17 සිට සියයට 61 දක්වා පරාසයක පැවතුනි. | ඉලක්කගත බීජ නිෂ්පාදනය කිරීම සඳහා ගොවිපලෙහි සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගත යුතු වීම. | -එම- |
| (ක) | කුණ්ඩසාලේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ බීජ ලබා ගැනීමේ අපේක්ෂාවෙන් වගා කර ඇති මාළු මිරිස් හා තක්කාලි වගාවන් සඳහා යොදා ගනු ලබන බිංදු ජල සම්පාදන පද්ධතිය නිසි අයුරින් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් හෙක්ටයාර් 1.65 ක වගා කර ඇති මාළු මිරිස්, තක්කාලි හා වම්බටු සඳහා ප්‍රමාණවත්ව ජලය සැපයීමට නොහැකි වී තිබුණි. | ප්‍රමාණවත් ජල සම්පාදනයක් වගාවට ලබාදීමට කටයුතු කළ යුතු වීම. | -එම- |
| (ග) | දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ගුවන්විදුලි ගොවි සේවා ඒකකය මඟින් විකාශණ කටයුතු සිදු කිරීමේදී බැහැර ප්‍රදේශවල ගොවීන් හා එම ප්‍රදේශවල කෘෂිකර්ම කාර්යාලයක නිලධාරියකු සම්බන්ධ වී සිදුකරන ගුවන්විදුලි පටිගත කිරීම් සමඟ රූපවාහිනී පටිගත කිරීම් එකවර සිදු කිරීම මඟින් පිරිවැය අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රව්‍ය දෘශ්‍ය පටිගත කිරීම් එකම අවස්ථාවක සිදු කිරීම මඟින් පිරිවැය පාලනය මෙන්ම වඩාත් කාර්යක්ෂම හා ඵලදායී වැඩ සටහන් නිර්මාණය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම කාර්යයන් දෙක ඒකාබද්ධ කොට ඉදිරි සැලැසුම් සකස් කිරීමත්, ඒ තුළින් ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව නිර්මාණය කිරීමට හැකිවේ. |
| (ච) | මදුරුකැටිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ තවාන් අංශයේ ඉදිකිරීම් කටයුතු සඳහා 2016 නොවැම්බර් 25 දින රු.195,610 කට මිලදී ගෙන තිබුණු බට සහ කම්බි 2018 සැප්තැම්බර් වනවිටත් ගබඩා තුළ නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම. | මෙම කාර්යය ඉදිරියේදී සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ජ) | පලතුරු ගම්මාන වැඩසටහන යටතේ නියමිත කාලය තුළදී ගොවින්ට පැළ ලබා නොදීමත් දැඩි නියං කාලය තුළදී පැළ බෙදා දීමත් සිදුකර තිබුණි. | පැළ බෙදාදීමේ වැඩසටහන සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඇතැම් කලාපවල පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් වැඩසටහන සාර්ථක කරගැනීමට අභියෝගයක් වූ බව, |
| (ට) | ඇතැම් පලතුරු ගම්මානවල වගාවන් එල දරන වයසේ පැවතියත් එලනොදැරීම සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙරලිගම සහ බැරගම දෙළුම් පළතුරු ගම්මානවල වගාවන්හි එල හටගත්තද ඒවා හොඳ තත්ත්වයෙන් නොපැවතීමත් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කර ගොවීන් කඩිනමින් දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව වීම. | පරිණත වුවද එල නොදරන මෙන්ම එම එලවල ගුණාත්මයේ පවතින අඩුපාඩු පිළිබඳව මේ වන විට පර්යේෂණ ආරම්භ කර ඇති බව අධ්‍යක්ෂ (පලතුරු පර්යේෂණ හා සංවර්ධන) විසින් මා වෙත දන්වා ඇත. |
| (ඩ) | පලතුරු ගම්මාන වැඩසටහන යටතේ විශේෂයෙන් අපනයන වෙළෙඳ පොළ සඳහා වාණිජ මට්ටමෙන් කෙසෙල් වගා කිරීම ප්‍රමුඛ කොට සළකා තිබූ අතර පසුගිය වර්ෂ 06ක කාලය තුළ කෙසෙල් පැළ 400 කින් යුතු එක් ගම්මානයක් පමණක් 2018 වර්ෂය වනවිට පිහිටුවා තිබීම තුළින් මූලික අරමුණු බිඳ වැටී තිබුණි. | ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ව්‍යාපෘතිය ආරම්භයේ දී බහුවාර්ෂික බෝග සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් ගම්මාන පිහිට වූ අතර, 2018 වර්ෂයේදී මධ්‍යකාලීන බෝගයක් වන කෙසෙල් වගාව සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී ඇති බව |
| (ණ) | දෙපාර්තමේන්තුව සතුව අපහරණය කිරීමට නියමිත කල් ඉකුත් වූ පළිබෝධනාශක ද්‍රව්‍ය කි.ග්‍රෑ.23,112 ක් සහ ලිටර් 2,040 ක් පැවති අතර ඒවා සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු නොකර 2018 දෙසැම්බර් 31 දින වන විටද ගබඩා කර පැවතුණි. | පරිසරයට හානි නොවන පරිදි සුදුසු පරිදි පළිබෝධනාශක ද්‍රව්‍ය අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (ත) | ශාකවල නිරෝගී බව ආරක්ෂා කිරීම සඳහා ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත පාර්ලිමේන්තුවේ සම්මත කර තිබුණද, පනතේ 12 වගන්තිය ප්‍රකාරව ශාක නිෂ්පාදන ආනයනය කිරීම සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් නියෝගයන් නිකුත් කිරීමට 2019 අප්‍රේල් 25 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ශාක නිෂ්පාදන ආනයනය කිරීම සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් නියෝගයන් නිකුත් කළ යුතු වීම. | මෙම පනතට අදාළව ජාතික ශාක නිරෝධායන සේවය මඟින් නව රෙගුලාසි සකස් කරමින් පවතී. එය මේ වන විට අවසන් අදියරෙහි පවතින බවත්, අවසන් කෙටුම්පත අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත් අධ්‍යක්ෂ (බී.ස.පැ.සං) විසින් මා වෙත දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ද) | ආනයන බලපත්‍ර ලබාදීම හා භෞතික පරීක්ෂාවට අදාළව ආනයනකරුවන් ලියාපදිංචිය, ලේඛනගත කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම යනාදී ක්‍රියාවලිය සඳහා පරිගණකගත ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවූ අතර භෞතික පරීක්ෂාවන්ට අදාළ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් වරාය පරිශ්‍රය තුළ පිහිටුවා ඇති ශාක නිරෝධායන සේවය තුළ නඩත්තු කළද එම පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ආනයනකරුවන් ලියාපදිංචිය, ලේඛනගත කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම යනාදී ක්‍රියාවලිය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම. | ආනයන බලපත්‍ර අංශය ඇතුළු ජාතික ශාක නිරෝධායන සේවයේ සියළුම අංශ සඳහා දත්ත ගබඩාවක් පවත්වාගත හැකි වන පරිදි පරිගණකගත මෘදුකාංග ක්‍රමවේදයක් සකස් කරමින් පවතින බව අධ්‍යක්ෂ (බී.ස.පැ.සං) විසින් මා වෙත දන්වා ඇත.වරාය පරිශ්‍රය තුළ පිහිටුවා ඇති පරිගණක දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යන්නේදැයි අධීක්ෂණය කිරීමට කොළඹ වරායේ ශාක නිරෝධායන ස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත පවරා ඇත. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ඇතැම් මධ්‍යස්ථානවල තිරසාර සංවර්ධන අරමුණුවලට යොමුව කටයුතු කරන ආකාරය පිළිබඳව නිලධාරීන් ප්‍රමාණවත් දැනුමකින් නොසිටි බවද, එයට අනුව ක්‍රියාකාරකම් පෙළගස්වා නොතිබූ බවද සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය සැලැසුම් හා ක්‍රියාමර්ග ගත යුතු බව. | කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩිකර ගැනීම වෙනුවෙන් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය හා සම්බන්ධ වී ඵලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 2,184 ක් වන අතර මෙයින් ජ්‍යෙෂ්ඨ සහ තෘතියික මට්ටමේ පුරප්පාඩු පිරවීමට මේ වන විට පවතින නඩු කටයුත්ත බාධාවක් වී පැවති අතර මෙම ගැටලුව ආයතනයේ | කඩිනමින් පුරප්පාඩු පිරවිය යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | එලදායීතාවයට සෘජුව බලපා ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | කම්කරුවන් 1,443 ක් සේවයේ යෙදවීම සඳහා 2015 හා 2017 වර්ෂවල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණු අනුමැතිය පරිදි බඳවා ගත් කම්කරුවන් නිසි පරිදි කළමනාකරණය කරමින් ඵලදායීව යොදා ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | කම්කරුවන් නිසි පරිදි කළමනාකරණය කරමින් කාර්යක්ෂමව හා සඵලදායීව යොදා ගත යුතු වීම. | අධ්‍යක්ෂ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන වෙතින් පිළිතුරු විමසා ඇතත්, මේ වන තෙක් පිළිතුරක් ලැබී නොමැත |
| (ඇ) | වීරවිල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ හා මදුරුකැටිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ සේවය කරනු ලබන පර්යේෂණ සහකාර නිලධාරීන් හා තාක්ෂණික සහායක නිලධාරීන්ට පසුගිය වසර 05 ක කාලය තුළ ලබා දී තිබූ පුහුණු අවස්ථා අවම මට්ටමක පැවතුණි. | නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනයට අවශ්‍ය පුහුණුවීම් අවස්ථා ලබාදීම මඟින් මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවීමට ක්‍රියාකළ යුතු වීම. | ඉදිරි වසරවලදීද නිලධාරීන්ට අවශ්‍ය පුහුණු අවස්ථා ලබාදීමට උපරිම උත්සාහයක් දරනු ලැබේ. |